බුද්ධශාසන අමාත්‍යාංශය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

154863

ශ්‍රී බු. ව. 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

7 ශ්‍රේණිය

විභාග අංකය :

කාලය පැය 01 යි.

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු සපයන්න.
(i) කොටස සඳහා ලකුණු (2 ×20) 40 යි. (ii) කොටස සඳහා ලකුණු (15×04) 60 යි.

## I කොටස

01 සිට 20 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. පළමු ධර්ම දූත පිරිසට අයත් නොවූයේ .........
    (i) පස්වග භික්ෂූන් වහන්සේලා ය. (ii) යස තෙරණුවන් වහන්සේ ය.
    (iii) යස තෙරණුවන්ගේ යහළු පිරිස ය. (iv) භද්දවග්ගිය තෙරවරු ය.

02. ආදිත්ත පරියාය සූත්‍රය අසා රහත් ඵලයට පත් වූවෝ කවරහු ද ?
    (i) උපතිස්ස පරිවැජියාය. (ii) කෝලිත පිරිවැජියාය.
    (iii) තුන් බෑ ජටිලයන් සහ දහසක් පිරිස ය. (iv) පස්වග මහණුන් ය.

03. වේළුවන උයන සසුනට පූජා කරන ලද්දේ කා විසින් ද ?
    (i) බිම්බිසාර රජතුමා විසිනි. (ii) සුද්ධෝදන රජතුමා විසිනි.
    (iii) කොසොල් රජතුමා විසිනි. (iv) අනාථපිණ්ඩික සිටුතුමා විසිනි.

04. ඍද්ධිමත් භික්ෂූන් වහන්සේලා අතර අග තනතුරට පත්වූයේ කවුද ?
    (i) සැරියුත් මහ රහතන් වහන්සේය. (ii) මුගලන් මහ රහතන් වහන්සේය.
    (iii) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය. (iv) අනුරුද්ධ මහ රහතන් වහන්සේය.

05. බුදුරජාණන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ නිසා .........
    (i) සුගත නම් වන සේක. (ii) අරහං නම් වන සේක.
    (iii) ලෝක විදූ නම් වන සේක. (iv) භගවා නම් වන සේක.

06. ප්‍රතිපත්ති පූජාවක් ලෙස සැලකෙන්නේ මින් කුමක් ද ?
    (i) බුද්ධ පූජාව (ii) බෝධි පූජාව
    (iii) සිල් රැකීම (iv) ආහාර පූජාව

07. බුදුගුණාලංකාරයේ කතුවරයා කවුද ?
    (i) අලගියවන්න මුකවෙටිතුමා ය. (ii) ධර්මසේන හිමියන් ය.
    (iii) වීදාගම මහා මෛත්‍රිය මාහිමියන් ය. (iv) ගුරුළුගෝමී පඬිවරයා ය.

08. නුවණැති බව, උත්සාහවන්ත බව හා ආත්ම විශ්වාසය පුද්ගලයාගේ දියුණුව ඇතිකරවන බව කියැවෙන ජාතක කතාව මින් කුමක්ද ?
    (i) චුල්ල පදුම ජාතකය (ii) චුල්ල සෙට්ඨි ජාතකය
    (iii) චුල්ල ධර්මපාල ජාතකය (iv) චුල්ල ධනුද්ධර ජාතකය

09. අප සිත් තුළ හටගැනෙන ප්‍රධාන අකුසල සිතිවිලි (අකුසල මූල) ගණන කීයද ?

(i) 03 කි. (ii) 05 කි.
(iii) 04 කි. (iv) 06 කි.

10. මෛත්‍රී භාවනාව වැඩීමෙන් ලැබෙන ආනිසංස එකොළහක් ගැන සඳහන්ව ඇත්තේ කිනම් සූත්‍රයේ ද ?

(i) කරණීයමෙත්ත සූත්‍රයේ ය. (ii) මිත්තානිසංස සූත්‍රයේ ය.
(iii) මෙත්තානිසංස සූත්‍රයේ ය. (iv) මහා මංගල සූත්‍රයේ ය.

11. දියුණුවන පුද්ගලයකුගේ ලක්ෂණ 15 ක් ඇතුළත් සූත්‍රය මින් කුමක් ද ?

(i) රතන සූත්‍රය. (ii) වසල සූත්‍රය.
(iii) පරාභව සූත්‍රය. (iv) කරණීය මෙත්ත සූත්‍රය.

12. සන්තුස්සක ගුණයෙන් නිරූපණය වන්නේ ............

(i) අධික මානය නැති බව යි. (ii) ලද දෙයින් සතුටුවන ගතිය යි.
(iii) පහසුවෙන් පෝෂණය කළ හැකි බව යි. (iv) මෘදු බව යි.

13. ධම්ම පදය, සද්ධම්මෝපායනය ආදී ග්‍රන්ථ ඇසුරින් ලියැවී ඇති කාව්‍ය කෘතිය මින් කුමක් ද ?

(i) සද්ධර්ම රත්නාවලිය. (ii) ලෝකෝපකාරය.
(iii) සුභාෂිතය. (iv) ලෝවැඩ සඟරාව.

14. කෝට්ටේ යුගයේ දී ලක්දිව සාහිත්‍යයට එකතු වූ විශේෂ සාහිත්‍යාංගය මින් කුමක් ද ?

(i) මහා කාව්‍ය (ii) වීර කාව්‍ය
(iii) උපදේශ කාව්‍ය (iv) ප්‍රශස්ති කාව්‍ය

15. "අභිධ්‍යා" යනු .......

(i) දැඩි ලෝභය යි. (ii) නොදැනීම යි.
(iii) තරහව යි. (iv) වැරදි දැකීම යි.

16. දස අකුසල් අතුරින් වචනයෙන් සිදුවන අකුසල කර්ම ගණන කීයද ?

(i) තුනකි. (ii) පහකි.
(iii) දෙකකි. (iv) හතරකි.

17. බුදුරජාණන් වහන්සේලාගේ තාවකාලික උපස්ථායකවරයකු නොවන්නේ මින් කවුද ?

(i) නාගිත තෙරණුවෝ ය. (ii) ආනන්ද තෙරණුවෝ ය.
(iii) උපවාන තෙරණුවෝ ය. (iv) චුන්ද තෙරණුවෝ ය.

18. උපන් ද සිට මරණය දක්වා අප ශරීරයේ සිදුවන වෙනස්වීම් හැඳින්වෙන ධර්මානුකූල පදය මින් කුමක් ද?

(i) ජාති දුක (ii) ව්‍යාධි දුක
(iii) ජරා දුක (iv) මරණ දුක

19. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර හා විඤ්ඤාණ යනු .............

(i) පංච නීවරණ යි. (ii) පංචස්කන්ධය යි.
(iii) පංච අභිඥා යි. (iv) පංච ශීලය යි.

20. තුන්වන ධර්ම සංගායනාව සිදුවූයේ බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කලකට පසුව ද ?

(i) වසර සියයකට පසුව ය. (ii) මාස තුනකට පසුව ය.
(iii) වසර දෙසිය තිස්හයකට පසුව ය. (iv) වසර දෙසිය දහඅටකට පසුව ය.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

01. හිස්තැන් පුරවන්න.

(i) චරථ භික්ඛවේ චාරිකං .................................. හිතාය බහුජන සුඛාය, ලෝකානුකම්පාය .................................. හිතාය සුඛාය දේව .................................. මා ඒකේන ද්වේ අගමිත්ථ.

(ii) බුදුරජාණන් වහන්සේ .................................. සහ ප්‍රතිපත්ති පූජා .................................. සුදුසු හෙයින් නම් වන සේක.

(iii) සියලුම වැරදි කරන්නේ .................................. අපිරිසිදු වීමෙන් නිසා, සිත .................................. කිරීම සඳහා ක්‍රමයක් බුද්ධධර්මයෙහි ඉදිරිපත් වේ. එයට .................................. යැයි කියනු ලැබේ.

(iv) බලෙන් හෝ .................................. සිත් ඇතිව සියතින් හෝ .................................. උපදෙස් දී ඔහු ලවා හෝ අනුන් සතු දෙයක් .................................. කළහොත් ඒ පවෙන් නිරයෙන් නිරයට පැමිණෙයි.

(v) කථාවත්ථුප්පකරණය සම්පාදනය වීමෙන් .................................. පිටකය සප්ත ප්‍රකරණයෙන් යුතුව සම්පූර්ණ විය. ඒ අනුව ථෙරවාදී පාලි .................................. සම්පූර්ණ වූයේ ද මෙම .................................. ධර්ම සංගීතියේදී ය.

(ලකුණු 03 × 5 = 15)

02. (i) ධර්මාශෝක රාජ්‍ය සමය ශාසනික වශයෙන් වැදගත් වන්නේ ඇයිදැයි පෙන්වා දෙන්න. (ලකුණු 05)

(ii) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්ම දූත කණ්ඩායම් පිටත් කළ රටවල් නවය හා එම දූත කණ්ඩායම්හි ප්‍රධානත්වය දැරූ හිමිවරුන්ගේ නම් සඳහන් කරන්න. (ලකුණු 10)

03. (i) පෞද්ගලික පිරිසිදුකම, පාරිසරික පිරිසිදුකම හා නිවැරදි සෞඛ්‍ය පුරුදු නිරෝගී දිවිපැවැත්මකට හේතුවන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

(ii) පෞද්ගලික පිරිසිදුකමට අදාළ නිවැරදි සෞඛ්‍ය පුරුදු පිළිබඳව ඔබේ පාසලේ සිසුන් දැනුවත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් පිළියෙළ කරන්න. (ලකුණු 10)

04. (i) පහත සඳහන් මංගල කරුණු පහ වෙන වෙනම හඳුන්වා දෙන්න.

(i) අසේවනාචබාලානං
(ii) පූජාචපූජනීයානං
(iii) බාහුසච්චං
(iv) විනයෝචසුසික්ඛිතෝ
(v) සුභාසිතාචයාවාචා

(ලකුණු 05)

(ii) මෙහි සඳහන් පළමු හා සිව්වන කරුණු ඔබේ ජීවිතය සාර්ථක කරගැනීමට උපකාර වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. (i) චතුරාර්ය සත්‍ය නම්කර, ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දක්වෙන පරිදි දුක්ඛ සත්‍යය හඳුන්වා දෙන්න. (ලකුණු 05)

(ii) ඉපදීම මෙන් ම මරණය දුක් ලෙස හඳුන්වා ඇත්තේ කවර හේතු නිසාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 10)

06. (i) ''යහපත් කොට යෙතැයි - සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි - කියති ඒ මුනිරජුට සුගතැයි ''

මෙම කවියෙහි සඳහන් බුදුගුණය විස්තර කර දක්වන්න. (ලකුණු 05)

(ii) ''සුප්පබුද්ධං පබුජ්ඣන්ති'' ....... මෙම ගාථාව නිවැරදිව සම්පූර්ණ කර ලියන්න. එහි අර්ථයද ලියන්න. (ලකුණු 10)

බුද්ධශාසන අමාත්‍යාංශය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී.බු.ව 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

07 - ශ්‍රේණිය

# පිළිතුරු පත්‍රය

(I) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (II) කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු සපයන්න.
(I) කොටසට ලකුණු (2 × 20) 40 කි. (II) කොටස සඳහා ලකුණු (15 × 4) 60 කි.

මූලාශ්‍රය - 07 ශ්‍රේණිය පෙළ පොත

## I - කොටස

**01.** නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

| ප්‍රශ්න අංකය | පිළිතුර | පිටු අංකය | ඡේදය/ ගාථාව/ පාඨය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | (IV) භද්දවග්ගිය තෙරවරු ය. | 02 | 03 | 02 |
| 02 | (III) තුන් බෑ ජටිලයන් සහ දහසක් පිරිස ය. | 03 | 02 | 02 |
| 03 | (I) බිම්බිසාර රජතුමා විසිනි | 04 | 01 | 02 |
| 04 | (II) මුගලන් මහ රහතන් වහන්සේ ය. | 04 | 03 | 02 |
| 05 | (II) අරහං නම් වන සේක. | 07 | 03 | 02 |
| 06 | (III) සිල් රැකීම | 07 | 04 | 02 |
| 07 | (III) විදාගම මහා මෛත්‍රේය මාහිමියන් ය. | 07 | 01 | 02 |
| 08 | (II) චුල්ල සෙට්ඨි ජාතකය | 14 | 03 | 02 |
| 09 | (I) 03 කි. | 15 | 04 | 02 |
| 10 | (III) මෙත්තානිසංස සූත්‍රයේ ය. | 18 | 02 | 02 |
| 11 | (IV) කරණීය මෙත්ත සූත්‍රය. | 25 | 01 | 02 |
| 12 | (II) ලද දෙයින් සතුටුවන ගතිය යි. | 27 | 03 | 02 |
| 13 | (IV) ලෝවැඩ සඟරාව | 29 | 01 | 02 |
| 14 | (III) උපදේශ කාව්‍ය | 29 | 01 | 02 |
| 15 | (I) දැඩි ලෝභය යි. | 33 | 04 | 02 |
| 16 | (IV) හතරකි. | 33 | 03 | 02 |
| 17 | (II) ආනන්ද තෙරණුවෝ ය. | 36 | 03 | 02 |
| 18 | (III) ජරා දුක | 42 | 02 | 02 |
| 19 | (II) පංචස්කන්ධය යි. | 44 | 01 | 02 |
| 20 | (IV) වසර දෙසිය දහඅටකට පසුව ය. | 56 | 02 | 02 |

## II - කොටස

| ප්‍රශ්න අංකය | | පිළිතුර | | | පිටු අංකය | ඡේදය/ ගාථාව/ පාඨය | ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| 01 | i. | බහුජන | අත්ථාය | මනුස්සානං | 02 | 02 | 03 |
| | ii. | ආමිස පූජා | ලැබීමට | අරහං | 07 | 04 | 03 |
| | iii. | සිත | පිරිසුදු | භාවනාව | 16 | 03 | 03 |
| | iv. | සොර | අනිකකුට | සොරකම් | 31 | 04 | 03 |
| | v. | අභිධර්ම | ත්‍රිපිටකය | තෙවන | 56<br>57 | 03<br>01 | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | (I) | මෙම යුගය වන විට විවිධ මතවාදයන් මගින් සසුනට හානි පැමිණි යුගයකි.<br>බ්‍රාහ්මණ බලය යළි නැඟී එමින් පැවතීම.<br>රාජ්‍ය අනුග්‍රහය නොලැබීම<br>ශාසන භාරදාරී තෙරකෙනකු නොවීම<br>ශාසනය විවිධ නිකායන්ට කැඩීයාම (නිකාය 18 පමණ) යන කරුණු නිසා පරිහාණියට පත්ව තිබූ බුදුසසුන යළි නගා සිටුවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම නිසා මෙම යුගය වැදගත් වේ. සසුන පිරිසිදු කිරීම, වෙහෙර විහාර ගොඩනැංවීම, රාජ්‍ය අනුග්‍රහය ලබාදීම, ධර්ම සංගායනාවක් සිදුකර ථේරවාද බුද්ධසමය නැවතත් පිරිසුදුව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු යෙදීම, නවරට ධර්ම ප්‍රචාරය සිදුකිරීම එම සේවාවන් අතර වේ. | 54<br>-<br>57 | | |
| | (II) | 1. කාශ්මීර ගන්ධාර - මජ්ඣන්තික තෙරණුවෝ<br>2. මහිසමණ්ඩලය - මහාදේව තෙරණුවෝ<br>3. වනවාස දේශය - රක්ඛිත තෙරණුවෝ<br>4. අපරන්ත දේශය - යෝනක ධම්මරක්ඛිත තෙරණුවෝ<br>5. මහාරට්ඨය - මහා ධම්මරක්ඛිත තෙරණුවෝ<br>6. යෝනක දේශය - මහා රක්ඛිත තෙරණුවෝ<br>7. සුවණ්ණ භූමිය - සෝණක හා උත්තර තෙරණුවෝ<br>8. හිමවන්ත දේශය - මජ්ඣිම තෙරණුවෝ<br>9. තම්බපණ්ණි දීප (ලංකාව) - මහා මහින්ද තෙරණුවෝ | 57<br>58 | 04<br>01 | 10 |
| 03 | (I) | පෞද්ගලික පිරිසිදු භාවය, පාරිසරික පිරිසුදු භාවය හා නිවැරදි සෞඛ්‍ය පුරුදු කෙටියෙන් හඳුන්වා දී පිරිසුදු බව හා සෞඛ්‍ය පුරුදු මැනවින් පවත්වාගෙන යාම නිරෝගී ජීවිතයක් සඳහා හේතුවන බව පැහැදිලි වන ප්‍රමාණවත් පිළිතුරක් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 05 ක් ලබා දෙන්න. | 51<br>-<br>53 | | 05 |
| | (II) | පෙළ පොතේ 11 වන පාඩම හා මෑතකාලීන (කොරෝනා සමයේ) අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් උක්ත කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලැබෙන ආකාරයේ කරුණු ඇතුළත් සටහනක් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 10 ක් ලබා දෙන්න. (පිළිතුරේ ස්වභාවය අනුව ලකුණු තීරණය කළ හැකිය) | 51<br>-<br>53 | | 10 |
| 04 | (I) | i. අසේවනා ච බාලානං - අයහපත් ගතිගුණ ඇති අය හෙවත් බාලයන් ඇසුරු නොකිරීම<br>ii. පූජා ච පූජනීයානං - පිදිය යුත්තන් පිදීම, මවපියන්, ගුරුවරුන්, පැවිදි උතුමන්, වැඩිහිටියන් පිදිය යුත්තෝ වෙති. ඒ අයට නිසි ගරුබුහුමන් කිරීමයි.<br>iii. බාහුසච්චං - බහුශ්‍රුත බව. එනම් උගත් බවයි. භාෂා ඇතුළු නොයෙක් ශාස්ත්‍ර ඉගෙනීමයි.<br>iv. විනයෝ ච සුසික්ඛිතෝ - මැනවින් හික්මුණු බව යි. සමාජයේ සදාචාර සම්පන්නව ජීවත් වීමට ඉගෙන ගැනීම යි.<br>v. සුභාසිතා ච යා වාචා - යහපත් වචන කථාකිරීම. බොරුව, කේළම, පරුෂ වචනය, හිස්වචනය බැහැරකර යහපත් වචන භාවිත කිරීම යි. | 45<br>-<br>47 | | 05 |
| | (II) | බාලයින් ඇසුරු නොකිරීම හා මැනවින් හික්මුණු බව යන කරුණු දෙක ප්‍රමාණවත් පරිදි විස්තර කර, සදාචාරසම්පන්න පුරවැසියකු බිහිකර ගැනීමට එම ගති ලක්ෂණ උපකාර වන අයුරු කෙටියෙන් පැහැදිලි කර තිබීම පිළිතුර තුළින් අපේක්ෂා කෙරේ. | | | 10 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (I) | 1.දුක්ඛ ආර්ය සත්‍යය<br>2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය<br>3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය<br>4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය<br><br>1. ඉපදීම දුකකි(ජාති).<br>2. දිරායාම දුකකි(ජරා).<br>3. ලෙඩවීම දුකකි(ව්‍යාධි).<br>4. මරණයට පත් වීම දුකකි(මරණ).<br>5. අප්‍රිය සම්ප්‍රයෝගය දුකකි.<br>6. ප්‍රිය විප්පයෝගය දුකකි.<br>7. කැමති දෑ නොලැබීම දුකකි.<br>කෙටියෙන් කියතොත් පංචඋපාධානස්ඛන්ධයම දුකකි.(මෙම කරුණු සියල්ල පැහැදිලිව සඳහන් කර ඇත්නම් මුළු ලකුණු ලබා දෙන්න) | 41 | | 05 |
| | (II) | 1. ජාති දුක - මිනිසකු වශයෙන් හෝ තිරිසනකු වශයෙන් හෝ වෙනත් කිසියම් සතකු වශයෙන් හෝ ඉපදීම දුකක් බව මෙයින් අදහස් වේ. ඉපදීම දුකක් වන්නේ ඉපදෙන විට දැනෙන දුක්ඛදායක වේදනාව නිසා ම නොවේ. ඉපදීමෙන් පසු විඳින්නට ලැබෙන සියලුම දුක් ඉපදීමේ හේතුව නිසා ම ඇතිවන ඒවා ය. ඒ නිසා ඉපදීම දුකකි. යම්තාක් ඉපදීම සිදුවේ ද ඒතාක් අනෙක් සියලු දුක් ද ඇති වේ. එනිසා ඉපදීම බලවත් ම දුකය.<br><br>2. මරණ දුක - ජීවිතයේ අවසානය මරණය යි. සැමදෙනාට ම මරණයට මුහුණ දීමට සිදු වේ. මරණයට පත් නොවී මරණ දුක හරිහැටි දැනගැනීමට නුපුළුවන. එහෙත් මරණයට පත්වීම මහා වේදනාකාරී සිදුවීමක් බව බොහෝ අයගේ මරණ මොහොත දෙස බලනවිට පෙනී යයි. මියයාමට පෙර කාලයක සිට මරණ බියෙන් බියපත්වසිටින්නෝ ද වෙති. මරණය ගැන ඇසීමට පවා බිය ඇත්තෝ අප අතර වෙති. කෙසේ වෙතත් සැම දෙනාටම යම් දිනක මියයන්නට සිදු වේ. කිසිවකු මැරෙන්නට කැමති නොවෙතත් ඉපදීමත් සමග මරණය දායාද කරගෙන පැමිණෙන නිසා ඊට මුහුණ දියයුතු ය. මේ නිසා මරණය දුකකි. | 42<br>43 | 01<br>01 | 10 |
| 5 | (I) | භාග්‍යවතුන් වහන්සේ සෝභමානව ගමන් කරන බැවින් සුගත නම් වන සේක.<br>භාග්‍යවතුන් වහන්සේ සුන්දර වූ නිවනට වැඩම කළ හෙයින් සුගත නම් වන සේක.<br>භාග්‍යවතුන් වහන්සේ යහපත් වචන කථාකරන බැවින් සුගත නම් වන සේක.<br>භාග්‍යවතුන් වහන්සේ සොභමානව ගමන් කරන බැවිනුත්, සුන්දර වූ නිවනට වැඩම කළ බැවිනුත්, යහපත් වචන කථාකරන බැවිනුත් සුගත නම් වන සේක. | 20 | 05 | 05 |
| | (II) | සුප්පබුද්ධං පබුජ්ඣන්ති - සදා ගෝතම සාවකා<br>යේසං දිවා ච රත්තෝ ච - භාවනාය රතෝ මනෝ<br><br>දිවා රෑ දෙක්හි ම - භාවනාවෙහි නියැලුණු<br>ගොයුම් ගොත් සව්වෝ - නිදා පුබුදිති සුවසේ | 24 | 06 | 10 |